මානවශාස්ත්‍ර අධ්‍යයන, 1999 (1), පිටු 15-25.

# උතුරුමැද පළාතේ ඓතිහාසික පසුබිම

කේ. ඩී. පරණවිතාන

## රජරට/පිහිටිරට

ශ්‍රී ලංකාවේ මුල් ම ජනාවාස ව්‍යාප්තවීමෙන් සියවස් කීපයකට පසු දිවයින මායා, පිහිටි, රුහුණු වශයෙන් ප්‍රධාන පාලන ඒකක නැතහොත් රටවල් තුනකට බෙදී යාම සිදුවිය. එය පරිපාලනයේ පහසුව සඳහා කරනලද ආරම්භක බෙදීමක් ලෙස සැලකිය හැකි ය. ඉහත කී බෙදීම් අනුව වර්තමානයේ උතුරුමැද පළාත නමින් හැඳින්වෙන භූමි ප්‍රදේශය 'පිහිටිරට'ට අයත් විය. 'පිහිටිරට'ට යන නමේ ප්‍රභවය අපැහැදිලි ය. දොළොස්වන සියවස අවසානයේ පටන් මේ ප්‍රදේශය 'පතිට්ඨරට්ඨ' යනුවෙන් වංසකථාකරුවන්[1] විසින් හඳුන්වනු ලැබ ඇතත් එසේ ව්‍යවහාර කිරීමට හේතුව ද පැහැදිලි ලෙස හඳුනා ගැනීමට නොහැකි ය.

අනුරාධපුර රාජධානිය වශයෙන් පැවති සමයේ, එනම්, නවවැනි සියවසේ දී පමණ වර්තමාන උතුරුමැද පළාත අයත් ප්‍රදේශය හඳුන්වන ලද්දේ 'රාජරට්ඨ' නැතහොත් 'රජරට' වශයෙනි.[2] අනුරාධපුරය නම් වූ ප්‍රධාන නගරයේ සතර දිශාව පාදක කොටගෙන 'උත්තරරට්ඨ' 'පච්ඡිම පස්ස' 'පාචීනපස්ස' සහ 'දක්ඛිණදෙස' යනුවෙන් 'රජරට' තවදුරටත් කොටස් හතරකට බෙදිණ.[3] මුඛ පරම්පරාගතව ආ කඩඉම් ලේඛනගත කොට ඇති **ශ්‍රී ලංකාද්වීපයෙහි කඩඉම් පොතේ** පිහිටි රටට අයත් ගම්දනව් 44 දක්වා ඇත.[4] එවා මෙසේ ය.

| | | |
|---|---|---|
| 01. අඹං දනව්ව | - | අඹන් ගඟ ආශ්‍රිත ප්‍රදේශය |
| 02. ආළිසාර | - | ඇළහැර |
| 03. මැලඳුර | - | ලග්ගල විල්ගමුව |
| 04. උඩුගොඩරට | - | උතුරු මාතලේ උඩුගොඩ |
| 05. අස්ගිරිය | - | මාතලේ අස්ගිරිය |
| 06. සිරියාලරට | - | හිරියාල |
| 07. ගොළුවැව | | |
| 08. මහගුළුරට | - | කිවුරටිය අසල මාගල්ලේ ගම |
| 09. සුරුගුළුරට | - | නිකවැරටිය සුරගල්ල |
| 10. කඩියාරට | - | කඩිගාවම |
| 11. පොළොන්නරුව | - | පොළොන්නරුව |
| 12. පඩ වැඩ | - | පඩුවස් නුවර |
| 13. කොට්ටපිටිරට | - | කෝට්ටියාරම |
| 14. මගලම්රට | - | ත්‍රිකුණාමලය |
| 15. කලාරට | - | කලාවැව |
| 16. සාලවල්ලිරට | | |
| 17. කැලිරට | - | ත්‍රිකුණාමලය |
| 18. මාවටුරට | | |
| 19. මන්නාරම | - | මන්නාරම |
| 20. කරඹවලානය | | |

21. තෙල්ලිවලානය
22. මාගුල්ගොමුවරට
23. කඳවුරු දහස්තොට
24. දඹුළු නුවර - දඹුල්ල
25. තඹගමුරට - තඹගමුව
26. කවුඩාවුළුරට
27. පළුවක්රට
28. කෝකාලරට
29. පදීරට
30. මෝරුරට
31. කුරුඳුගමුරට
32. මානාවතුරට
33. කුඩාවැලිගම්රට
34. ජාවාගච්ජෙරිරට - චාවාකච්චේරි
35. මාරච්චිරට - නෙතමරච්චි
36. වලතඩිරට
37. මඩුවල්ලියාරට
38. කතුකින්නියා - මුලතිව් කතුක්කේනි
39. ගන්තලාරට - කන්තලේ
40. මින්නේරිරට - මින්නේරිය
41. කඩුඩාවුළුරට - කවුඩුල්ල
42. වෙල්ගම්රට - විල්ගම්වෙහෙර
43. ගොනාවතුර - කලාවැව
44. අනුරාධපුර නුවර[5]

ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහවැනි සියවස දක්වා කාලය මුළුල්ලේ ම ලංකාවේ පැවති රාජධානිවල පාලන මධ්‍යස්ථානය වූ අනුරාධපුරය, දකුණු ඉන්දීය චෝළ ආක්‍රමණත් සමග අනුරාධපුරයෙන් මදක් නැගෙනහිරින් පිහිටි පොළොන්නරුවට මාරු විය. පොළොන්නරුවේ ද රාජධානියක් වශයෙන් අවසාන පිළිසකර කිරීමක් ගැන සඳහන් වන්නේ 1293 දී පමණ ය.[6] ඒ දෙවැනි භුවනෙකබාහු (1293-1302 ) සිය රාජ්‍යයේ මධ්‍යස්ථානය කුරුණෑගලට මාරු කළ අවස්ථාවේ දී ය. ඉන් අනතුරුව රජරට නැතහොත් පිහිටි රට යනුවෙන් හැඳින්වුණු ප්‍රදේශයෙන් වැඩි කොටසක් වනගත විය. ඒ සමග ම රජරට රජතුමාගේ කේන්ද්‍රීය පාලනයෙන් දුරස්ථ විය.

## වන්නිය

අනුරාධපුරය හා පොළොන්නරුව යන රාජධානි දෙක ම පරිහානියට පත්වූ නිසා වල්බිහිවූ පිහිටි රට දහතුන්වැනි සියවසේ දී 'වනය' යන අරුත් ඇති 'වන්නිය' යන වචනයෙන් හැඳින්වීම ආරම්භ වූවා සේ සැලකිය හැකි ය.[7] ආරණ්‍යක වන්නි ප්‍රදේශය සම්පූර්ණයෙන් ම ජනශූන්‍ය ප්‍රදේශයක් වූයේ යයි සිතීම සාවද්‍ය ය. වන්නියෙහි පැතිරී තිබුණු ජනාවාස වෙනුවෙන් අර්ධ ස්වාධීන වූ පාලන නායකයන් බිහිවීම ද මේ යුගයේ දී ම ආරම්භ විය.

'වන්නිය' යන වචනය ප්‍රථම වරට චූලවංසයේ සඳහන් වන්නේ[8] විජයබාහු රජතුමාගේ (1232-1236) රාජ්‍ය කාලය ආශ්‍රිතව ය. සතුරන්ට විරුද්ධව සටන් කිරීම සඳහා ඔහු බොහෝ කලක් වන්නියෙහි සැඟවී සිට සේනා සංවිධානය කළේ ය. ඒ කාලයේ වන්නියේ ස්වාධිපත්‍යය ඔහු යටතට ගෙන තිබිණ. මින් පසුව වන්නිය ගැන චූලවංසකරුවාගේ අවධානය යොමුවන්නේ දෙවැනි පරාක්‍රමබාහු (1236-1270) රජතුමාගේ රාජ්‍ය සමයේ දී ය. ඔහුට දඹදෙණියේ රාජ්‍යයක් පිහිටුවීම සඳහා වන්නියෙන් ජනයා හා ද්‍රව්‍යාධාර ලැබිණ.[9] මේ කාලය වන විට වන්නිවරුන් නිදහසේ තම පාලන කටයුතු කරගෙන යාම ආරම්භ කළ අවධිය සේ සැලකිය හැකි ය.[10]

‘වන්නි කුමාරවරු’ නමින් හැඳින්වුණු වන්නියේ සිටි ප්‍රධානීන් තුන්වැනි විජයබාහු රජතුමා(1232 -1236) වෙත තුටු පඬුරු පුදකළ බව **චූලවංසයේ** සඳහන් වේ.[11] මේ අනුව ‘වන්නිහුරු’ නම් කුලයක් ද වර්ධනය විය. වන්නිහුරුන්ගේ ප්‍රධානියා ‘**මහවන්නියා**’ යනුවෙන් හැඳින්වීම 1270 දී පමණ ආරම්භ විය. වන්නි කුමාරවරු දඹදෙණිය, යාපහුව සහ කුරුණෑගල රජවරුන් සමග සමීපව කටයුතු කළහ. විජයබාහු රජතුමාගේ (1232-1236) අභිෂේක මංගල්‍යයේ දී වන්නි කුමාරවරුන් සහභාගි වු බව චූලවංසකරුවා සඳහන් කිරීමෙන් පෙනෙන්නේ ඒ වනවිටත් වන්නි කුමාරවරුන් ප්‍රාදේශිය පාලකයන් බවට පත්ව සිටි බවයි.[12]

වන්නි ප්‍රදේශයේ පාලනය පිළිබඳව නැවතත් දැනගන්නට ලැබෙන්නේ කෝට්ටේ හයවැනි පැරකුම්බා (1411-1466) රජතුමාගේ රාජ්‍ය සමයේ දී ය. ඔහුගේ විසිවැනි රාජ්‍ය වර්ෂයේ දී එනම්, 1431 දී පමණ, යාපාපටුන නැතහොත් වර්තමාන යාපනය අල්ලා ගැනීම සඳහා මෙහෙයවන ලද සටනේ ප්‍රථම අවස්ථාව වශයෙන් හයවන පැරකුම්බා රජතුමා වන්නියේ පාලකවරුන් තමාගේ පාලනය යටතට පත් කර ගත්තේ ය.[13]

**රාජාවලියේ** සඳහන්වන හැටියට පළමුවන රාජසිංහ රජතුමාගේ (1587-1593) අණසක යටතේ පැවැති ප්‍රදේශ අතර කන්ද උඩරට, ඌව, පානම, වෙල්ලස්ස සහ වන්නි දහඅටක් විය.[14] **ගිරා සංදේශයේ** ද වන්නි පත්තු දහඅටක් හයවැනි පැරකුම්බා රජු විසින් ජයගත් බව සඳහන් වේ.[15] එබැවින් වන්නි පත්තු දහඅට හඳුනා ගැනීමේ හැකියාවක් එකල තිබෙන්නට ඇත. මින් අනතුරුව වන්නි ප්‍රදේශය ස්ථිර වශයෙන් ම රාජධානි දෙකකට, එනම්, යාපනයට සහ මහනුවරට මැදිව, දෙපක්ෂය විසින් ම සිය ආරක්ෂාව සඳහා භාවිත කළ ප්‍රදේශයක් බවට පත් විය. මේ හේතුන් නිසා මහනුවර රාජධානියට අයත් ප්‍රදේශ සිංහල වන්නි ප්‍රදේශය බවට ද, යාපනය රාජධානියට ආසන්න ප්‍රදේශය දෙමළ වන්නි ප්‍රදේශ බවට ද පත් විය. මේ ප්‍රදේශවල බිහිවූ වැඩවසම් ජනනායකයෝ යුද හෝ කලබලකාරී කාලවල දී තමන් වඩා සමීප වු රාජ්‍යයට සම්බන්ධව ක්‍රියා කළහ. වන්නි ප්‍රධානීන් ප්‍රධාන කොටස් හතරකට වගී කළ හැකි ය. උතුරින් යාපා පටුනේ සහ ඒ ආශ්‍රිතව සිටි අය, නැගෙනහිරින් ත්‍රිකුණාමලය ආශ්‍රිත ප්‍රදේශවල සිටි අය, මඩකලපුව ආශ්‍රිතව සිටි මුක්කුවා ජනයා, වයඹ දෙසින් පුත්තලම ආශ්‍රිතව සිටි අය සහ දකුණින් සිංහල වන්නි ප්‍රදේශවල සිටි ජනනායකයන් වශයෙනි.[16]

දහසයවන සියවසේ පෘතුගීසි පාලන සමයේ දී ඉහත දැක්වු තත්වය වඩාත් තහවුරුව පැවැති අතර වන්නි පාලකවරු තමතමන්ගේ ප්‍රදේශ වෙන් කොටගෙන පාලනය කළහ. ඔවුන් තමන් වන්නියාර්වරුන් වශයෙන් සෘජුව ම හඳුන්වාගන්නා ලද නමුත් ඔවුන් කිසිවෙකුටත් පෘතුගීසි යුදබලය ඉදිරියේ ක්‍රියා කිරීමට තරම් ශක්තියක් නොවි ය. කෝට්ටේ රජවරුන් වන්නියාර්වරුන් තමන්ගේ අණසකට යටත් බව කියා සිටියත්, 1467 දී හයවැනි පැරකුම්බා රජතුමාගේ අභාවයෙන් පසු වන්නියට කෝට්ටේ සිංහල රජවරුන්ගෙන් සැලකිය යුතු බලපෑමක් සිදු නොවීය.[17] පෘතුගීසි පාලන සමයේ පැවති විශේෂත්වය වුයේ වන්නිය යාපනයේ හා මහනුවර පාලනයෙන් වෙන් කොට තැබීමට ක්‍රියා කිරීමයි. එයට හේතුව වුයේ උතුරේ මුහුදුබඩ ප්‍රදේශවල සිට මහනුවරට සැපයුම් මාර්ගයක් වශයෙන් වන්නිය තහනම් ප්‍රදේශයක් කිරීමට හැකි වීමයි.[18]

පෘතුගීසීන්ට පසුව පැමිණි ලන්දේසීහු වන්නි ප්‍රදේශයේ සිය අණසක පතුරුවා එහි ආදායම් උපයා ගැනීමට සමත් වූහ. ලන්දේසීහු වන්නියේ බොහෝ ප්‍රදේශ පරීක්ෂාකර ඉන් ලබාගත හැකි ආදායම් මාර්ග ගැන සොයා බැලූහ. ඒ අතර ඔවුහු අනුරාධපුරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළහ. ලන්දේසි ආණ්ඩුකාර රයික්ලොෆ් වන් හුන්ස් (1664-1675) තම අනුප්‍රාප්තිකයාට ලබාදුන් වර්තාවේ අනුරාධපුරය පිළිබඳ විස්තරයක් දක්වා ඇත. අනුරාධපුර ප්‍රදේශය වන්නිය හැටියට අඳුනාගත් ඔහු එය ඉතා වැදගත් ප්‍රදේශයක් බව සඳහන් කළේ ය. එහි ඇති විශ්වාසකළ නොහැකි තරම් විශාල ජලාශ, විශාල ගොඩනැගිලිවල නටබුන් සියල්ල මිනිස් දෑතින් කර ඇතිබව ඔහු සඳහන් කළේ ය. එම ප්‍රදේශය අනුරාධපුර නුවර යනුවෙන් හැඳින්වෙන බවත් නගරය වටා යාමට යටත් පිරිසෙයින් පැය 12 වත් ගතවන බවත් හෙතෙම විශ්වාස කළේ ය. එහි ඇති ගොඩනැගිලි, විවිධාකාර වූ ගල්කුළුණු සහ පුවරුවලින් පෙනීයන එක් සත්‍යයක් නම් මේ ප්‍රදේශය කලෙක බොහෝ සරුසාරව පැවතීම යයි ඔහු විශ්වාස කළේ ය.[19] ලන්දේසි තානාපතිවරයෙකු වශයෙන් 1620 දී මහනුවරට ගිය මාසේලිස් බොෂවුවර් සඳහන් කරන හැටියට මහනුවර රජතුමාගේ පාලන ප්‍රදේශ අතරට අනුරාධපුරය ද අයත් වී තිබිණ.[20]

වන්නිය ගැන මීළඟට විස්තරක් කරන්නේ 1669 සිට 1679 දක්වා මහනුවර රාජධානියේ සිරකරුවකු වශයෙන් සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් ය. 1681 දී එංගලන්තයේ දී ප්‍රකාශයට පත් වූ ඔහුගේ **ලංකා විස්තරයේ** නුවරකලාවිය උතුරු කොටසේ 'රටවල්' නමින් හැඳින්වෙන බෙදීම් පහක් වූ බවත් නැගෙනහිරට පැවැතියේ තමන්කඩුව හා බින්තැන්න බවත් සඳහන් කරයි.[21] උඩරට රාජධානියේ සිර අඩස්සියෙන් මිදුණු නොක්ස් 1679 දී අරිප්පුව බලා ගමන්කර ඇත්තේ අනුරාධපුරය හරහා ය. අනුරාධපුරය පසුකර යන ගමනේ දී මල්වතුඔය දිගේ ගමන් කළ බවත්, ගංගාව හරහා ගල් කුළුණු මත ගොඩ නගන ලද ගල්පාලම් තුනක් දුටු අතර ඒවා කඩා වැටී තිබුණු බව ද සඳහන් කරයි. ප්‍රදේශය ජනඝනයෙන් යුක්ත නොවුවත්, අනුරාධපුරයෙහි ආරක්ෂක මුරපොලක් පැවති අතර, එහි විසූජනයා මහනුවර රජතුමාට පක්ෂපාතී අය වූ බවත් සඳහන් කර ඇත. ඔහු පැනයන්නට පෙරාතුව කීපවිටක් නුවරකලාවියට ගොස් තිබිණ. එක්වතාවක් හුරුළුවැව දක්වා ගොස් ඇත. තවත් විටෙක එප්පාවල නැවතී සිටි අතර, තවත් වරක් කාලවිල වන්නි උන්නැහෙගේ ආගන්තුකයෙකු වශයෙන් ගතකර ඇත. 1679 ඔක්තෝබර් 12 දින මහනුවර රාජධානියෙන් පැනගිය නොක්ස්, අරිප්පුවේ ලන්දේසි කොටුවට ළඟා වී ඇත්තේ ඊට දින හයකට පසු එනම්, ඔක්තෝබර් 18 වැනිදා ය.[22] ලන්දේසි යුගයේ දී (1640-1796) වන්නිය කෙරෙහි ලන්දේසීන් විශේෂ උනන්දුවක් දැක්වූයේ අලිඇතුන් වෙළඳාමෙන් විශේෂ ආදායමක් ලබාගැනීම පිණිස ය. ඒ සඳහා වන්නියාර්වරුන් සමග ගිවිසුම් කීපයකට[23] එළඹි අතර, ඒ අනුව දළ වශයෙන් වසරකට අලි ඇතුන් 42 ලන්දේසි පාලකයින් වෙත සැපයිය යුතුව තිබුණු බව තෝමස් වන් රේ (1693-1697) ආණ්ඩුකාරයා 1697 තම වාර්තාවෙහි සඳහන් කර ඇත.[24]

ත්‍රිකුණාමලයේ සිට මහනුවරට තානාපති ගමනක නිරත වූ ජෝන් පයිබස්, 1762 ලියූ සිය වාර්තාවේ මෙසේ සඳහන් කරයි. 'මම එක් වන්නියාර් වරයෙකුගෙන් කරුණු දැනගතිමි. ඔහුගේ රට ඇත්තේ දිවයිනේ උතුරු දෙසිනි. ඔහු වාසය කරන්නේ වවුනියා දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ වෙඩ්ඩිකුලම් හි ය. ඔහු තමා මහනුවර රජතුමාගේ පාලන ප්‍රදේශයට අයත් ලෙස නොසලකයි. එහෙත් ඔහු මහනුවර රජතුමා සමග මිත්‍රත්වය පවත්වාගෙන යයි. ලන්දේසීන් සමග එදිරිවාදුකම්

ඇතිවූ අවස්ථාවල දී ඔහු රජුගේ පාර්ශවය ගෙන ඔහුට සහාය වෙයි.[25] පයිබස් සිය ගමන් වාර්තාවේ තමන්කඩුව පිළිබඳව ද සඳහන් කර ඇත. ඔහු කොට්ටියාරමෙන් ගොඩබැස තමන්කඩුව හරහා මහනුවරට යන විට ඒ ප්‍රදේශ මහනුවර රජුගේ පාලනය යටතේ පැවැති බව දැනගන්නට ලැබී ඇත. ඒ ප්‍රදේශය තමන්කඩුව නමින් හැඳින්වූ බවත්, එහි ගම් 60 පමණ විසූවන් සියලුදෙනා ම සිංහලයන් වූ බවත් සඳහන් කර ඇත.[26]

ලන්දේසි පාලන සමයේ වන්නි ප්‍රදේශයේ කොටස් යාපනය, මන්නාරම, පුත්තලම, මුලතිව් සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවලට වඩා සමීපව පැවැතිණි. එසේ ම වන්නියේ පාලනය ද අවස්ථාවට උචිත පරිදි නිරන්තරයෙන් ම දකුණින් උතුරටත්, උතුරින් දකුණටත් වෙනස්වෙමින් පැවතිණ. මේ හේතුව නිසා වන්නි ප්‍රදේශයේ ස්ථාන නාම සිංහලෙන් සහ දෙමළෙන් භාවිත වීම ආරම්භ විය. ස්ථාන නාම දෙමළ වුව ද, සිංහල පදිංචිකරුවන් ඒවා වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට උත්සාහයක් දරා නැති බව ආර්. ඩබ්ලිව්. අයිවර්ස් උතුරුමැද පළාත පිළිබඳ සිය අත්පොතේ සඳහන් කර ඇත.[27]

## ඉංග්‍රීසි පාලන සමයේ වන්නිය

මහනුවර රජතුමා විසින් පත්කරන ලද දිසාවරුන් විසින් සිංහල වන්නි ප්‍රදේශවල 1745 සිට1815 දක්වා නාමික පාලනයක් පවත්වාගෙන යන ලදී. දිසාවේවරුන් වැඩිපුර වාසය කළේ මහනුවර ය. දිසාවේවරයෙකු සාමාන්‍යයෙන් දිසාවනියේ පදිංචියට ගියේ රජතුමා තදින් ක්‍රියාකරන්නෙකු වුවිට හෝ ඔහු කෙරෙහි රජතුමාගේ විශ්වාසය අඩුවූ අවස්ථාවල ය. දිසාවේවරුන් විසින් රජයේ ආදායම එකතු කරන ලද්දේ සුලු මුලාදෑනීන් යෙදවීමෙනි. 1815 මාර්තු මාසයේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව නුවරකලාවිය සහ තමන්කඩුව ප්‍රදේශවල මහනුවර රජතුමා විසින් පත්කරන ලද දිසාවරුන්ගේ බලපෑම නතර විය. එතැන් පටන් අනුරාධපුරය ඇතුලු නුවරකලාවියේ පාලන බලය හැකිතාක් දුරට පවත්වාගෙන යාමට නුවරවැව වන්නි උන්නැහෙ විසින් උත්සාහ දරන ලදී. ඔහු 1818 කැරැල්ලේ දී ඌවේ දිසාව වශයෙන් සිටි කැප්පෙටිපොල වැනි නායකයින් සමග සම්බන්ධ වී ක්‍රියා කරීම නිසා අපේක්ෂිත බලය බ්‍රිතාන්‍ය පාලනයෙන් ඔහුට ලබාගත නොහැකි විය.[28] කෙසේවෙතත් මේ වන විට නුවරකලාවියේ සැලකියයුතු නායකත්වයක් නුවරවැව සහ තාමරවැව පවුල්වලට හිමිව තිබිණ. තමන්කඩුවට මෙවැනි නායකත්වයක් ලැබී තිබුණේ නැත. තමන්කඩුව නායකත්වයක් නොලැබීම හේතුවෙන් වැව්වල ජලය හිගකම පිළිබඳව මැසිවිලි නැගීමට මේ ප්‍රදේශයේ නිලධාරීන් ගියේ ත්‍රිකුණාමලයේ කලෙක්ටර්වරයා වෙතට ය.[29] තමන්කඩුවේ සිටි සුළු මුලාදෑනීන් මෙකල තමුන් හඳුන්වාගත්තේ මොහොට්ටාලවරුන් යටතේ සිටින වන්නියාර්වරුන් වශයෙනි.[30]

නුවරකලාවියේ නැගෙනහිර, එනම්, හුරුළු, තාමරවැව, මාමිනියා සහ උලගල්ල පත්තු 1815 අප්‍රේල් 28 දින දරන ආඥාවට[31] අනුව, මහනුවර කොමසාරිස් මණ්ඩලයේ පාලනය යටතට ගැනිණ. ඒ අවස්ථාවේ දී මේ පත්තුවල අධීක්ෂණය පැවරුණේ මාතලේ හෝ නාලන්ද සිටි සහකාර ඒජන්තවරයාට ය. නුවරකලාවියේ බටහිර කොටස, එනම් හත්කෝරලේ කුරුණෑගල ඒජන්තවරයාගේ

පාලනයට යටත් කරන ලදී. තමන්කඩුවේ පාලනය පැවරුනේ මින්නේරිය සහකාර ඒජන්තවරයාට ය. 1818 නොවැම්බර් 21 දින දරන ආඥාවෙන් නුවරකලාවියේ පාලනය "අස්ථාවර තත්වයක" තැබිණ. නැවතත් 1819 සැප්තැම්බර් 18 දින දරන ආඥාවකින් නුවරකලාවිය මහනුවර කොමසාරිස් මණ්ඩලයේ පාලනය යටතේ අදාල ඒජන්තවරුන්ගේ අධීක්ෂණයට යොමුකරන ලදී. ඒ අනුව, කිරලව, මතොම්බුව, උඳුරව, කලගමුව, හුරුළු, මහපොතාන සහ මින්නේරිය, මාතලේ සහකාර ඒජන්තවරයාගේ අධීක්ෂණය යටතට ගැනිණ. පරවහ, කහල්ල, නැගම්පහ, කලාගම, එප්පාවල, උඩුගල හා නුවරගම් යන කොටස් කුරුණෑගල සිටි සත්කෝරලේ ඒජන්තවරයා යටතට පත් විය.

එක් ඉංග්‍රීසි හමුදා ඛණ්ඩයක් 1803 දී මින්නේරියෙහි නවතා තැබිණ. අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා ටික කලකින් එය ඉවත් කරන ලදී. නැවතත් එය 1815 සිට 1818 දක්වා කැරලි සමයේ ද ස්ථාපිත කළ නමුත් මුලින් සඳහන් කළ හේතුව නිසා ම එය ද ඉවත් කර ගැනිණ.[32] ත්‍රිකුණාමලයේ කලෙක්ටර් සහ තමන්කඩුව ඒජන්ත යන තනතුරු දෙක එකම පුද්ගලයෙකු වෙත පවරන ලදී. එහෙත් තමන්කඩුව තවදුරටත් මහනුවර කොමසාරිස් මණ්ඩලයේ පාලනය යටතේ තබන ලදී. තමන්කඩුව ඒජන්තවරයාගේ කාර්යාලය පළමුව මින්නේරියේ පිහිටුවන ලද නමුත් පසුව එය මින්නේරියේ ත්‍රිකුණාමල මාර්ගයේ, මින්නේරියට සැතපුම් $14\frac{1}{2}$ ක් ඈතින් පිහිටි පුලියන්කඩවලට ගෙන යන ලදී. මේ තත්ත්වය 1828 දක්වා පැවැති අතර එම වර්ෂයේ පීටර් ඇන්ස්ට්‍රුදර් තමන්කඩුව ඒජන්තවරයා වශයෙන් පත්කරන ලදී. මේ වන විට ත්‍රිකුණාමල කලෙක්ටර්වරයා වූයේ එවකට සුප්‍රසිද්ධ සිවිල් නිලධාරියෙකුව සිටි පර්සිවල් ඇක්ලන්ඩ් ඩයික් ය. නුවරකලාවියට නැගෙනහිරින් පිහිටි ප්‍රදේශවල තොරතුරු මෙසේ වුවත්, 1848 කුරුණෑගල ඒජන්තවරයාගේ ලේඛනාගාරය ගින්නකින් පිළිස්සීයාම නිසා නුවරකලාවියේ බටහිර ප්‍රදේශය පිළිබඳ 1815 සිට 1833 දක්වා තොරතුරු අපට අහිමිව ගොස් ඇතිබව ආර්. ඩබ්ලිව්. අයිවර්ස් මහතා සඳහන් කරයි.[33]

1815 දී මුළු දිවයින ම බ්‍රිතාන්‍ය යටතට පත්වූ පසුව එළඹුණු ප්‍රථම පරිපාලන සංවිධානය 1833 කෝල්බෲක් කොමිෂමේ යෝජනා අනුව සිදුවිය. ඒ අනුව උඩරට රාජධානියේ පරිපාලන කටයුතු සඳහා පත්කොට තිබූ මහනුවර කොමසාරිස් මණ්ඩලය අක්‍රීය තත්ත්වයට පත් වූ අතර 1833. 01. 01 දින දරන ආඥාවෙන් විල්මට් හෝටන් ආණ්ඩුකාරයා (1831-1837) විසින් දිවයින ම ප්‍රධාන පළාත් පහකට බෙදා වෙන්කරන ලදී. ඒවා උතුරු නැගෙනහිර, බස්නාහිර වයඹ සහ දකුණු වශයෙන් නම් කොට ආණ්ඩුවේ ඒජන්තවරු පස් දෙනෙකුගේ පාලනය යටතට පවරන ලදී.[34] රට අභ්‍යන්තරයේ දිස්ත්‍රික්ක හැකිතාක් දුරට මුහුදුබඩ පළාතක ඒජන්තවරයෙකුගේ පාලන ප්‍රදේශයකට සම්බන්ධ කරන ලදී. නුවරකලාවිය එසේ සම්බන්ධ කරන ලද්දේ යාපනය ප්‍රධාන නගරය වශයෙන් පැවති උතුරු පළාතට ය. තමන්කඩුව යා කරන ලද්දේ ත්‍රිකුණාමලය ප්‍රධාන නගරය වශයෙන් පැවති නැගෙනහිර පළාතට ය.

උතුරු පළාතේ ඒජන්තවරයා වූ පර්සිවල් ඇක්ලන්ඩ් ඩයික්, ජෝර්ජ් ටර්නර්ගේ උපදෙස් මත නුවරකලාවියේ කෝරළවලට කෝරාළවරු පත්කරන ලදී. ඒ අනුව එතෙක් පැවති මුදියන්සේ යන තනතුරු නාමය අභාවිතයට ගියේ ය. පත්තු වෙනුවට කෝරළ නාමය ද, ගන්ආරච්චි යන පැරණි තනතුරු නාමය වෙනුවට කාරියකරවන හෝ ලියන්නා යන නිල නාමය ද සහිත නිලධාරීහු

තුලාන්වලට පත්කරනු ලැබිණ. ගමේ ප්‍රධානියා හඳුන්වන ලද්දේ ගමරාළ යනුවෙනි. 1833 පාලන ප්‍රතිසංස්කරණ නිසා එතෙක් නුවරකලාවියට නාමික වශයෙන් පැවති ඉංග්‍රීසි පාලනය වඩාත් තහවුරු විය.

නුවරකලාවිය දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසුව එහි පාලන මධ්‍යස්ථානය කුමන ස්ථානයක පිහිටුවියයුතු ද යන්න පිළිබඳව සලකා බලන ලදී. රිටිගල පිහිටුවා තිබූ පැරණි ඉංග්‍රීසි ආරක්ෂක ස්ථානය ඊට සුදුසු වනු ඇතැයි ජෝර්ජ් ටර්නර් අදහස් කළේ ය. එහෙත් බොහෝ කරුණු සැලකිල්ලට ගත් උතුරු පළාතේ ආණ්ඩුවේ ඒජන්තවරයා වූ ඩයික් මහතා, අනුරාධපුරය එහි පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගත්තේ ය.

ලෙෆ්ටිනන්ට් තෝමස් ස්කිනර් සමග අනුරාධපුර අරිප්පු මාර්ගය සකස්කිරීමේ යෙදුණු ලෙෆ්ටිනන්ට් ජේ. මැකාස්කිල් නුවරකලාවියේ ප්‍රථම සහකාර ඒජන්තවරයා වශයෙන් 1833 ඔක්තෝබර් මාසයේ දී පත්කරන ලදී. ඔහුට සිංහල කථාකිරීමට නොහැකිවීමත්, කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් අනුරාධපුරයෙහි නොතිබීමත් නිසා නව පත්වීම හේතු කොට ගෙන ඔහුට මහත් අපහසුතාවයකට මුහුණ දෙන්ට සිදුවිය.[35] පාලන මධ්‍යස්ථානය වශයෙන් අනුරාධපුරය දියුණු කිරීම හා ප්‍රාදේශිකව ඇතිකරන ලද පාලන සංවිධානය ස්ථාවර තත්ත්වයකට පත්කරන ලද්දේ 1837 සිට1842 දක්වා සහකාර ඒජන්තවරයා වශයෙන් සිටි ටී. මයිලියස්ගේ පාලන කාලයේ දී ය. ඔහු විසින් ඇති කරන ලද දියුණු තත්වය 1873 දක්වා පැවතිණ.

අනුරාධපුරය පාලන මධස්ථානය වශයෙන් ස්ථාවර තත්වයකට පත්වුවත් ප්‍රදේශයේ පැවති අයහපත් සෞඛ්‍ය තත්වය නිසා නිලධාරීන්ගේ රාජකාරීවලට නිරන්තරයෙන් බාධා සිදුවිය. ඊට පිළියමක් වශයෙන් 1850 සිට 1864 දක්වා සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 15 දින සිට ඊළඟට එළඹෙන වර්ෂයේ පෙබරවාරි මස 15 දා තෙක් අනුරාධපුරයේ සේවය කළ රජයේ නිලධාරීන් වෙනත් පළාත්වලට යවා ඒ කාලය තුළ කාර්යාල වසා දමන ලදී. උප ඒජන්තවරයා පුහුණුව සඳහා යාපනයට හෝ මන්නාරම කච්චේරියට ගියේ ය.[36] අනුරාධපුරයේ පිහිටුවා තිබූ පාලන මධ්‍යස්ථානය සම්පූර්ණයෙන් ම අතහැර දැමීමට යෝජනාවක් 1850 දී පමණ ඉදිරිපත් විය. උඩරට රාජධානියේ පාලනය යටතේ පැවති නුවරකලාවිය, උතුරේ දෙමළ පළාතකට සම්බන්ධ කිරීම පිළිබඳව මේ වන විට විශාල මහජන අප්‍රසාදයක් ගොඩනැගී තිබිණ. දේශීය ප්‍රධානීන් බොහෝ දෙනෙක් උඩරට සිංහල අයගෙන් පැවතෙන්නන් වූ බැවින් ඔවුන්ට නුහුරු සිරිත් විරිත් හා භාෂාවට විරෝධතා දැක්වූයේ, ඔවුන් විසින් ඉදිරිපත් කරන දින පොත්, වාර්තා ආදිය නොසැලකිලිමත් ලෙස පවත්වාගෙන යාමෙනි. ඇතැම් දේශීය නිලධාරීහු අසනීප නිවාඩු ලබාගෙන වනසතුන් දඩයමේ ගියහ. බෝලයක දමා ගම්වලට යවන ලද නිවේදන සහ දැන්වීම් ආදිය ගමින් ගමට ගියත් අවසානයේ දී යායුතු තැනට නොගොස් අතුරුදහන් විය. එය ද දේශීය නිලධාරීන් ඕනෑකමින් කරනලද ක්‍රියාවක් විය.[37]

ඉංග්‍රීසි ආණ්ඩුකාර විලියම් හෙන්රි ග්‍රෙගරි (1872 -1877) විසින් 1873 සැප්තැම්බර් මස 6 දින නිකුත්කරන ලද නියෝගයකින් නුවරකලාවිය, තමන්කඩුව හා හත්කෝරළේ දෙමළ හත් පත්තුව එක් කොට දිවයිනේ හත්වැනි පළාත වශයෙන් උතුරු මැද පළාත පිහිටු වන ලදී.[38] නව පළාතේ ප්‍රථම එජන්තවරයා හැටියට පත්කරන ලද්දේ ජෝන් ප්‍රෙඩ්රික් ඩික්සන් මහතාය. 1875 ජනවාරි මස 01 දින නිකුත් කරන ලද නියෝගයක් මගින් හත් කෝරළේ දෙමළ හත් පත්තුව

නැවත වයඹ පළාතට එක්කරන ලදී. උතුරුමැද පළාතේ නව පළාත් මායිම් 1874 සැප්තැම්බර් මස 22 දින දරන නියෝගයක් අනුව තහවුරු කරන ලදි.[39] ඒ අනුව උතුරුමැද පළාතට වර්ග සැතපුම් 4384 ක භූමි භාගයක් අයත් විය. කුඩා බෙදීම්වල සැලකිය යුතු වෙනසක් සිදු නොවී ය. හර්බර්ට් වයිට් විසින් 1903 දී සම්පාදනය කරන ලද **ලංකා අත්පොතේ**[40] අතුරුමැද පළාත වර්ග සැතපුම් $4002\frac{1}{2}$ සහ ජනගහනය 79110 පමණ වූ බව සඳහන් කර ඇත. මෙසේ වර්ග සැතපුම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වුයේ හත්කෝර්ලේ දෙමළ හත් පත්තුවේ වර්ග ප්‍රමාණය අඩුවීම නිසා ය.

1886 දී පනවන ලද නියෝගයකින් ප්‍රථමවරට අනුරාධපුර නගරයේ සීමා වෙන්කරන ලදී. ඒ අනුව බටහිරට තිසාවැවේ බැම්ම ද, දකුණට වෙස්සගිරි විහාරය ද, උතුරට මල්වතු ඔය ද, නැගෙනහිරට මල්වතු ඔයේ සිට බටහිරට පිටරවුම්පාර දක්වා අඳින ලද රේඛාවකින් ද අනුරාධපුර නගරයේ සීමා ප්‍රථමවරට වෙන් කෙරිණ.[41]

උතුරුමැද පළාතේ ආණ්ඩුවේ ඒජන්තවරයා වූ ජේ. එෆ්. ඩික්සන් අනුරාධපුරය ගැන 1877 සිය වාර්තාවේ සඳහන් කර ඇත්තේ මෙසේ ය. අවුරුදු හතරකට පමණ පෙර අනුරාධපුරය කැලෑවෙන් වැසී තිබුණු බෞද්ධ නටබුන්වලින් සමන්විත ස්ථානයකි. එහි තිබුණේ කච්චේරියත්, උසාවි ගොඩගනැගිල්ලත්, ඉංග්‍රීසි නිලධාරියකුගේ හුදකලා නිවසක්, ගෙවල් කීපයක් සහ කුඩා කඩපළකි. මෙකී ගොඩනැගිලි පවා කැලයෙන් වටවී තිබිණ. කැලෑව හරහා තිබූ පාරවල මහනුවර, යාපනය, පුත්තලම හා ත්‍රිකුණාමලයට යන එන බරකරත්ත ගමනාගමනය සිදුවිය. කැලය හෙළි නොකරන ලද අඩිපාරවල කොතැනකවත් යාර විස්සකට වඩා ඉදිරිය දැකගත නොහැකි විය. එම පාරවල හෝ ප්‍රධාන පාරවල අසෙකු පිටින් යාම වුව ද අනතුරු සහිත ය.[42]

ව්‍යවස්ථාදායක සභාවේ තේරීම් කමිටුවක් මගින්, 1883 දී නුවරකලාවිය වයඹ පළාතටත්, තමන්කඩුව නැගෙනහිර පළාතටත්, යාකිරීමට යෝජනාවක් ඉදිරිපත් විය. එවකට උතුරුමැද පළාතේ ආණ්ඩුවේ ඒජන්තවරයාව සිටි ජේ. එෆ්. ඩික්සන් එම යෝජනාවේ අයෝග්‍යතාව පිළිබඳව යටත් විජිත ලේකම්වරයා වෙත කරුණු ඉදිරිපත් කොට ඒත්තු ගැන්වීමෙන් පසුව ඉවත දමන ලදී.[42]

රජයේ ආධාර ඇතිව කලාවැව ප්‍රදේශයේ දෙමළ ජනාවාස පහිටුවීම සඳහා රාජ්‍ය ලේකම් විසින් 1892 දී කරන ලද යෝජනාවක් ද සම්පූර්ණයෙන් ම අසාර්තක විය. මේ පිළිබඳ විස්තරයක් 1893 අංක 4 දරන සැසි වාර්තාවේ ඇතුළත්ව තිබේ.[43]

නුවරකලාවිය දිස්ත්‍රික්කය, නුවරගම්, හුරුළු, කලාගම් යන පළාත්වලින් සමන්විත ය. 1903 දී ඒවායේ පහත සඳහන් දේශීය නිලධාරීහු සේවය කළහ.

| | | | | |
|---|---|---|---|---|
| ආදායම් | රටේ මහත්මයා | පළාත් | 3 | තුන්දෙනයි |
| | කෝරාළ | කෝරළ | 18 | අහඅටදෙනයි |
| | ආරච්චි | තුලාන | 65 | හැටපස් දෙනයි |

| | | | | |
|---|---|---|---|---|
| | වීදිය ආරච්චි | බසාර් | 11 | එකොලොස් දෙනයි |
| | සාම නිලධාරී | බසාර් | 02 | දෙදෙනයි |
| වාරිමාගී | වැව් ලේකම් | කෝරළ | 18 | දහඅට දෙනයි |
| | වෙල් විදානෙ | | | |
| අධිකරණ | ගම්සභා උසාවි | | | |
| | සභාපති | පළාත් | 03 | තුන්දෙනයි |
| | කොර්නර්වරයා | | | |

තමන්කඩුව පත්තු 12 කට බෙදී තිබිණ. ඒවා මෙසේ ය.

මෙගොඩ පත්තුව/මඩිගේ පත්තුව/එගොඩ පත්තුව
කවුඩුළු පත්තුව/කටුනේ පත්තුව/වැදි පත්තුව
කැලේගම පත්තුව/ගල්ලැල්ල පත්තුව/මහ වීදි පත්තුව
කුඩාකර පත්තුව/ගිරිතලේ පත්තුව සහ වේල්ලවඩි වශයෙනි.

තමන්කඩුවේ ද පත්තු භාර දේශීය නිලධාරීන් තමන් හඳුන්වාගන්නා ලද්දේ වන්නියාර් නමිනි. පසුකාලයක දී මේ පත්තු 12 සිංහල පත්තුව, මරක්කල පත්තුව නොහොත් මෙගොඩ පත්තුව හා එගොඩ පත්තුව වශයෙන් විශාල පරිපාලන ඒකක තුනකට ඒකාබද්ධ කරන ලදී.

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ 'පිහිටිරට,' 'රජරට', 'වන්නිය' යන නම්වලින් හඳුන්වන ලද විශාල ප්‍රදේශයෙන් වැඩි කොටස් වෙන් කිරීමෙන් බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1873 දී වර්තමාන උතුරුමැද පළාත නිර්මාණය කරන ලදී. ප්‍රදේශයේ ජනගහනය වැඩිවීම, මංමාවත් දියුණුව හා ආර්ථික වශයෙන් ඊට හිමිවුණු වැදගත් ස්ථානය නිසා දිවයිනේ පරිපාලන බෙදීම් අතර උතුරුමැද පළාතට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මේ ලිපියේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ක්‍රිස්තුවර්ෂාරම්භයේ පමණ සිට විසිවන සියවසේ ආරම්භය දක්වා තොරතුරු පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක් කිරීම කෙරෙහි ය. විසිවන සියවසේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා තවත් මෙබඳු ලිපියක් සම්පාදනය කළ යුතුව ඇත. එය මී ළඟ කලාපයක දී පාඨකයන් වෙත ඉදිරිපත් කිරීමට හැකිවනු ඇත.

(මේ ලිපිය සම්පාදනයේ දී මහාචාර්ය යූ. බී. කරුණානන්ද මහතා උතුරුමැද පළාත සම්බන්ධයෙන් පළකොට ඇති කෘති බෙහෙවින් ප්‍රයෝජනවත් විය.)

## සටහන්

01. චූලවංශය, LXXXVIII පරිච්ඡේදය, 87 ගාථාව.
අභයවර්ධන. එච්. ඒ. පී. කඩඉම්පොත් විමර්ශනය, කොළඹ, ,1978, 96 පිටුව.
02. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සම්පාදිත ලංකා ඉතිහාසය, පළමු වෙළුම, 13 පිටුව.
03. අභයවර්ධන, කඩඉම්පොත් විමර්ශනය, 73 පිටුව.
04. අභයවර්ධන, කඩඉම්පොත් විමර්ශනය, 96-97 පිටු.
05. අභයවර්ධන, කඩඉම්පොත් විමර්ශනය, 96-97 පිටු.
06. Ievers, R. W. , *Manual of the North-Central Province of Ceylon,* Colombo, 1899, p. 33.
07. Lewis, J. P. *Manual of the Vanni Districts, Vavuniya and Mullathivu of the Nothern Ceylon,* Colombo, 1895.
08. චූලවංශය, LXXXI පරිච්ඡේදය, 13 ගාථාව.
09. චූලවංශය, LXXXVII පරිච්ඡේදය, 26-27 ගාථා.
10. Ievers, Manual..., p. 36.
11. චූලංශය, පරිච්ඡේදය, 87-98 ගාථා.
12. චූලවංශය, 51 ගාථාව.
13. De Silva, K. M., *A History of Sri Lanka,* Delhi, 1981, p. 88.
14. Bell, H. C. P., *Report on the Kegalla District,* Colombo, 1892, p. 7.
15. ගිරා සංදේශය. 130 පද්‍යය.
16. De Silva, K. M., *A History of Sri Lanka,* p. 85.
17. Abeyasinghe, Tikiri, *Portusuese Regimentos on Sri Lanka,* Colombo, p. 9.
18. Abeyasinghe, *Portuguese Regimentos...*, p. 78. note 116.
19. Goens, Rijcklof van, *Memoir of Rijcklof van Goens Govemor of Ceylon to his successor Jacob Hustaart and Rijcklof van Goens* (Jr.) 1675, Colombo, p. 42.
20. Ievers, Manual..., p. 39.
21. Knox, Robert, *Historical Relation of the Island of Ceylon,* London, 1681.
22. Ievers, *Manual...*, p. 40.
23. ශ්‍රී ලංකා ජාතික ලේඛනාගාරය, 1/2507 සහ 2508.
24. Rhee, Thomas van, *Memoir of Thomas van Rhee to his successor Gerrit de Heere,* 1697, Colombo, (1915), p. 6.
25. Pybus, John, *Account of Mr Pybus Mission to the King of Kandy in* 1762, Colombo, 1862, p. 25.
26. Pybus, John , *Mission...*, pp. 44-45.
27. Ievers, R.W., *Manual...*, p. 39.
28. Ievers, R.W., *Manual ...*, p. 50.

9. Ievers, R.W., *Manual* ..., p. 52.

0. Ievers, R.W., *Manual*..., p. 52

1. මේ ලිපියෙහි එන ආඥා ඒ දිනවලට අදාල ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවී ඇත.

2. 1815 උඩරට අල්ලා ගැනීමෙන් පසු උඩරට ප්‍රදේශවල පාලනය සඳහා පත්කරන ලද කොමිසම මේ නමින් හැඳින්විණ.

3. Ievers, R.W., *Manual*..., p. 63.

4. *Report of the Committee of Executive Council on the Fixed Establishments of Ceylon,* 1848, p. 28.

5. Ievers, R.W., *Manual*..., p. 66.

6. Ievers, R.W., *Manual*..., p. 67.

7. Ievers, R.W., *Manual*..., p. 67.

8. ශ්‍රී ලංකා ජාතික ලේඛනාගාරය, 5/201.

9. White, Herbert, *The Ceylon Manual*, Colombo, 1904.

0. Ievers, R.W., *Manual*..., p. 74.

1. Ievers, R.W., *Manual*..., p. 74.

2. Ievers, R.W., *Manual*..., p.75.

3. *Sessional Peper*, No. 4 of 1893.